




සම්මානිත මහාචාර්ය
කුසුමා කරුණාරත්න

# ජන කවියයි, ගැමි සුවඳයි - 1

බොහෝ සමාජවලට හිමිව පවත්නා උරුමයන් ලෙස විවිධාකාර අංග දක්නට ලැබේ. ඒ අතුරෙන් ජනශ්‍රැතිය ප්‍රධාන ස්ථානයක් ගන්නා බව අමුතුවෙන් කිව යුතු නොවේ. ජනශ්‍රැති හා බද්ධ වූ ජන කවිය ද ඇතැම් විද්ශීය රටවල මෙන්ම ශ්‍රී ලාංකික සමාජයේ ද අතීතය ගැන බොහෝ දේ කියාපාන ප්‍රබල අංශයකි. අද මෙන් එදා විද්‍යාව හා තාක්ෂණය දියුණුව නොපැවතුණ ද අපේ මුතුන් මිත්තන්ගේ හදවත් තුළ වූ සංවේදී බව සමග එක් වූ සුවිශාල දැනුම් සම්භාරයක් ප්‍රකට කරවීමෙහිලා අප සතු ජන කවි සමත් වෙයි. එදිනෙදා ජීවිතයේදී, සෙසු මිනිසුන් හා ගැහැණුන් සමග පවත්වාගෙන ගිය සම්බන්ධතාවලදී ඔවුන් තුළ පහළ වූ කවි සිතුවිලි අගනා සංකල්පනා ලෙස කවියට නැගුණි. එවන් මහඟු චින්තන රටාවක් ඉදිරි පරපුරට දායාද කළ අපේ ගැමි වැඩිහිටියෝ විරල වශයෙන් වුවද අදත් සිය ගම්බිම්වල එවන් සුන්දත්වයක් අත්විඳිමින් දිවි ගෙවති.

අපේ ගැමියන් තමන් ජීවත් වූ, එමෙන්ම කටයුතු කළ පරිසරය මැනවින් අධ්‍යයනට කළ අයුරු ජන කවියෙන් විශද වෙයි. බාල වියේ සිටම තම උපවිඥානයේ රැඳුණු සුන්දර ගැමි ජීවන රටාව හා ඒ පිළිබඳ අත්දැකීම් ගැමි තරුණ තරුණියන් මෙන්ම වැඩිහිටියන් ද ප්‍රකාශ කළ අදහස් හා ප්‍රතිචාරවලින් මැනවින් ප්‍රකට වෙයි. අද මෙන් විධිමත් පාසල් අධ්‍යාපනයකින් ලද දැනුමක් නොවූවත් ඔවුන් අවට පරිසරයෙන් මෙන්ම සිය සරල ජීවන ක්‍රමයෙන් ද ලද දැනුම් සම්භාරය අතිමහත්ය.

ගැමි ජනතාව වසරක් පාසා ජීවිතයේ විවිධ අවස්ථා පසු කරමින්, ඒස මගම තමන්ට ආවේණික වූ විවිධ උත්සව චාරිත්‍ර ආදිය ඉටු කරමින් ගෙවූ කාල පරිච්ඡේදය සැබවින්ම ඔවුන්ට සුන්දර අත්දැකීම් වූ බවට සැකයක් නැත. මව් උකුලේ නැළවෙන දරු සිඟිත්තා වෙනුවෙන් මෑණියන් ගයන දරු නැළවිලි ගී, දරුවාගේ ජීවිතයේ සෞන්දර්යය පිළිබඳව මුල් පියවර තැබීමක් වැනිය. එම නැළවිලි ගීවල ඇති ළයාන්විත බව හා රිද්මය ළදරුවාගේ මනස සෞන්දර්යයෙන් පෝෂණය කිරීමට ද සමත් වෙයි.

"දොයි දොයි දොයි දොයිය බබා
බයි බයි බයි බයිය බබා................................"

එකල මෙම නැළවිලි හඬ නොඇසූ දරුවකු, එම නැළවිලි කවි නොගැයූ මවක ගැමි පරිසරයේ නොසිටි තරම්ය. වචනවල අරුත විග්‍රහ කිරීමකට වඩා මෙහි ඇත්තේ ශබ්දය හා තාලය මගින් දරුවා නින්දට යැවීමේ අවශ්‍යතාවකි. අද පවා බිළිඳු දරුවකුට "දොයියන්න මයෙ පුතේ" යයි නිකම් හෝ පැවසුවොත් එයින් ද හැඟවෙන්නේ දරුවා නින්දට යැවීමේ උත්සායයි. එම වචනය පුන පුනා යොදමින්, තව දුරටත් නිශ්චිත අරුතක් පළ නොකෙරෙන "බයි, බයි, බයි" යන්න ද එක් කරමින් එම නැළවිලි තාලයට අනුව දරුවා නින්දට යැවීම ගැමි මවකගේ ප්‍රයත්නය විය. ඉංග්‍රීසි බසින් "ලලබයි" හෝ "ලලබි" යනුවෙන් යෙදෙන්නේ ද දරු නැළවිලි හැඳින්වීමටය. කෙසේ නමුත් "දොයි බයි" වැනි වදන් නැලවිලි තාලයට ගැයීම එදා ගැමි මව්වරුන්ට කිසි විටෙකත් නුදුරු දෙයක් නොවීය. එමගින් මතු කළ ගැමි සුවඳ අදත් අප සිත් තුළට, හදවත් තුළට යළි යළිත් අළුත් වෙමිනී දැනෙන්නා සේය.

දරුවන්ගේ සිහින ලොවේ, පියඹා යන සමනලුන්, පාට පාට මල්, කුරුල්ලන් සිටිය හැකි බව සිතිය හැකිය. එසේ වුවද ඇතුන්, ඇතින්නියන් පිළිබඳ හැඟීමක් ළදරු මනස තුළ නොතිබෙන්නට පුළුවන. එසේ වවුද, අප අතර ජනප්‍රිය දරු නැළවිලි කවක් වන,

"ඔන්න බබෝ ඇතින්නියා
ගල් අරඹේ සිටින්නියා
ගලින් ගලට පනින්නියා
බබුට බයේ දුවන්නියා"

යන කවෙන් මතු කරන දර්ශනය සැබවින්ම ළමා සිත් තුළ මවා පෑමක් ජන කවියා අපේක්ෂා කරන්නට නැතුවා විය හැකිය. මෙවන් නැළවිලි කවකින් වැඩි වශයෙන් අපේක්ෂා කෙරුණේ එම පද මාලාවෙන් මතු වී එන ළයාන්විත බව සමඟ දරුවාට වඩා පහසුවෙන් නැළවෙන්නට ඉඩ සැලැස්වීමය. මෙලෙසින් ගත් කල්හි, ගැමි සමාජය තුළ අතිශයින් ජනප්‍රිය වූ දරු නැළවිලිවලින් වඩාත්ම අපේක්ෂා කෙරුණේ එහි ඇතුළත් ගීතමය බව සමග මතුවන සෞන්දර්යය දරුවාට දැනෙන්නට සැලැස්වීම යයි කිව හැකිය. කෙසේ නමුදු ළපටින් ආදරයෙන් රැක බලා ගනිමින් සමාජයේ ඉදිරි ගමනට අත දීමේ සාමූහික කාර්යභාරයට උර දුන් අපේ ගැමියන් අතර ප්‍රචලිත වූ මෙවන් කවි මගින් ඔවුන්ගේ ජන ජීවිතයේ පැතිර පැවති ගැමි සුවඳ මෙන්ම සුන්දරත්වය ද මොනවට පැහැදිලි වෙයි.

මිනිස් ජීවිතය තුළ කවර පුද්ගලයකුට වුවද, ආහාරපාන, නිවාස, රැකවරණ ආදිය මෙන්ම විනෝදාස්වාදය ද අත්‍යවශ්‍ය වෙයි. වත්මන් සමාජයේ ජීවත්වන අප විනෝදය සඳහා නිරත වන දේවලින් තරමක් වෙනස් වුවද අතීතයේදී ගැමි ජනතාව විවිධ මාර්ග වලින් තම සතුට හා විනෝදය ලබා ගැනීමට යොමු වූහ. අදත් අපට කලාතුරකින් හෝ අසන්නට, දකින්නට ලැබෙන ජන ක්‍රීඩා එදා ගැමි පරිසරය තුළ ජීවත් වූවනට නොමඳව විනෝදය සැලසූ ඒවා විය. කාන්තාව වැඩි වශයෙන්ම නිවස තුළ රැඳී සිටිමින්, ගෘහ කටයුතුවල නියැලෙමින් දිවි ගෙවීම එකල සමාජයේ අපේකෂාව වුවද සීමිත වශයෙන් හෝ කාන්තාව වෙනුවෙන් වෙන් වී තිබූ ජන ක්‍රීඩා ගැන අපට අසන්නට ලැබේ. සිංහල අලුත් අවුරුද්ද සමරමින් පංචි කෙළිය, ඔන්චිල්ලා පැදීම වැනි ක්‍රීඩාවල කාන්තාවට නිරත වීම සඳහා සමාජයෙන් අවසර ලැබුණි. ඒ හැරුණ විට ගෘහස්ථ ක්‍රීඩාවක් ලෙස කාන්තාවන් වැඩි වශයෙන් කළ ඔළිඳ කෙළිය ද එලෙසින්ම සම්මතව තිබූ ජන ක්‍රීඩාවකි.

සිංහල ජන කවි අතර ඔංචිලි වාරම් කවි හා ඔළිඳ කවි කාන්තාවන් සඳහා විශේෂ වූ කවි ලෙස ගත හැකිය. මේ අතුරෙන් වඩාත් ප්‍රකට කවියකි, පහත දැක්වෙන්නේ,

"ඔංචිලි චිලි චිල්ල මලේ
වැල්ල දිගට නෙල්ලි කැලේ
කඩන්න බැරි කටු අකුලේ
කඩා දියන් මගේ මලෙ"

ගැමි පරිසරයේ හැදුණු වැඩුණ කවරකුගේ වුවද මතකයේ රැඳී ඇති මෙවන් කවියක් ශ්‍රවණය වෙද්දී අප සිත් තුළ මැවී පෙනෙන්නේ නිල්වන් ගොයමෙන් සරු වෙල් යායෙන් සුන්දරත්වය ප්‍රකට වන නිසංසල ගැමි පරිසරයයි. විශේෂයෙන්ම අළුත් අවුරුදු සමරන දින කිහිපය තුළදී වෙනදා නොමැති නිදහසක් භුක්ති විඳින අපේ ගැමි කතුන් වර්ණවත් රෙද්ද සහ හැට්ටයෙන් සැරසී මෙවැනි ඔංචිලි වාරම් කවි, තාලයට ගයමින් විනෝද වන අයුරු අපගේ මතකයට නැංවෙන්නේ ඒ සියල්ල හා බද්ධ වූ ගමේ සුන්දරත්වය හා ගැමි සුවඳ ද එක් කරමිනි.

ජන කවි අතර විවිධ තාලයට ගැයීමට හැකි අන්දමේ නිර්මාණ බොහෝය. ඔංචිල්ලාවක් පැද්දෙන තාලයට සරිලන පරිදි විවිධ ආකාරයෙන් ගායනා කරන්නට සුදුසු වන ඔංචිලි වාරම් කවි අප සතු ජන කවි සමූහය අතර වෙයි.

"පදින කලට අඟනෝ ඔංචිල්ලා
අඳින සළුව තද කර ඇඳපල්ලා
තදින් අතින් වැල් අල්ලා ගල්ලා
සොඳින් වරල බැඳගෙන පැදපල්ලා"

මෙහි පෙනෙන පරදි, ඇතැම් ජන කවිවල දක්නට නොලැබෙන තරම් අර්ථවත් බවක් ද මෙම කවියෙන් මතු කර දක්වයි. සාමාන්‍යයෙන් කාන්තාවකගේ ඇඳුම් පැලඳුම් අතින් සමාජය අපේක්ෂා කළ විනීත භාවය මෙහි හඟවන එක් කරුණකි. ඔංචිල්ලාව උඩ යනවිට, එහා මෙහා පැද්දෙන විට, සුළඟට ද හසු වෙමින් යන ඇඳුම් ලිහිල් වන්නට ඉඩ නොතබා, ඔංචිලි පදින කතුන්ට කරන දැනුම් දීමක් බඳු අදහසක් මෙහි අන්තර්ගතය. සිංහල ගැමි සංස්කෘතිය උරුම කරගත් ජන සමාජය ඇඳුම් පැලඳුම් විෂයයෙහි කාන්තාවගෙන් අපේක්ෂා කළ සංවර බව මෙම අවස්ථාව මගින් ද උද්දීපනය කර ඇත. වත්මන් සමාජය තුළ තරුණ පෙළ යොමු වී ඇති ඇතැම් විලාසිතා සමග සැසැඳීමේදී එදා ගැමි චින්තනයෙහි මතු වී පෙනුණ සංයමය වඩාත් කැපී පෙනෙනු ඇත.

ඔංචිලි වාරම් කියමින් සතුටින්, විනෝදයෙන් ඔංචිල්ලා පදින ගැමි කතුන්ගේ ආරක්ෂාව පිළිබඳව ද සමාජය බෙහෙන් අවධානය යොමු කළ ආකාරය මෙහි තුන් වන පදයෙන් ගම්‍ය වෙයි. උඩ යන ඔංචිල්ලාවේ හිඳ සිටින්නන්ගේ ආරක්ෂාව ඔවුන්ට සිහිපත් කරවන්නක් ලෙස දෙන උපදෙසකි, "තදින් අතින් වැල් අල්ලා ගල්ලා" යන යෙදුම. මිනිස් ජීවිතයක වටිනාකම මෙන්ම පවුලක සාමාජිකයන් අතර ද එකිනෙකාගේ ආරක්ෂාව අතිශය වැදගත් කොට තකන ආකාරයක් මෙහි දැක්වෙයි. එලෙසින්ම, ගැමි තරුණියන් හෝ බාල දැරියන් වුවත් තම දිගු කෙස් කළඹ මුදා හැරගෙන ඔංචිල්ලා පැදීමට ගියහොත් එය පැටලී යාමෙන් විය හැකි අනතුරු වළකා ගැනීමට දෙන උපදෙසකි, මෙහි සිවු වන පදයෙන් කියවෙන්නේ. කාන්තාවකගේ සුන්දරත්වය මතු කර පෙන්වන දිගු කෙස් කළඹ ලිහිල්ව තබා ගෙන සිටීමට ද ගැමි තරුණියන් ආශාවක් නොදැක්වූවා නොවේ. එසේ වුවද උඩ පහත යමින් පැද්දෙන ඔංචිල්ලාවේ නැග යද්දී එසේ හස කෙස් මුදා හැර සිටියොත් කවර හෝ උපද්‍රවයක් විය හැකි යයි සිතූ ගැමි කවියා සිය රචනාවට ද රසවත් බවක් එක් කරමින් කාන්තාවන්ට කාරුණික උපදේශයක් දෙන ආකාරය මෙයින් පෙනේ.

ගැමි පරිසරය තුළ ජීවත් වූවන් අතර විවිධ දුෂ්කර රැකියාවන්හි නිරත වෙමින් දිවි ගැට ගහගත්තවුන් කොතෙකුත් සිටි බව නොරහසකි. එසේ වුවද, ඒ කවර කාර්යයකදී හෝ දුක් කරදර හා මහන්සි අමතක කරන්නට ඔවුහු ජන කවියේ පිහිට පැතූහ. කරත්ත පදවමින් තම ජීවිකාව ගෙන ගිය ගැමියා දිග ගමනක් යමින් තම කාර්යය ඉෂ්ඨ කරගන්නට සිදුවූ අවස්ථාවලදී වෙහෙස මහන්සිය නිවී යන සේ ගැයූ කරත්ත කවි ද සිංහල ජන කවි අතර විශේෂත්වයක් දරයි. අපට හොඳින් හුරු පුරුදු කරත්ත කවියක්, නැතහොත් ගැල් කවියක් නිදසුනක් ලෙස මෙහිදී දැක්විය හැකිය.

"තණ්ඩලේ දෙන්න දෙපොළේ දක්කනවා
කටු කැලේ ගාල නොලිහා වද දෙනවා
හපුතලේ කන්ද දැකලා බඩ දනවා
පව් කළ ගොනේ ඇඳපන් හපුතල් යනවා"

සාමාන්‍යයෙන් ගැමියන් සිය ගොවිතැන් කටයුතු සඳහා යොදාගන්නා ගවයා ගැන සඳහන් කළේ විශේෂ නමකිනි. "අම්බරුවෝ" යනුවෙන් හැඳින්වුණ ගවයාට වැඩි ගෞරවයක් දීම සඳහා "පුතා" වැනි වචන ද ඔවුහු පාවිච්චි කළහ. කෙසේ නමුදු "ගොනා" යන වචනය ඉහත දැක්වූ පැදියේ මෙන්ම වෙනත් ජන කවි වලද අපට හමු වෙයි.

"වෙල් යායක ගොන් දෙන්නෙක් කකා උනී
ඉන් එක ගොනෙක් වලිගය නැතිව වැනී
වලිගය ඇති ගොනා මැස්සන්ට බැට දුනී
දුප්පත් කමත් වලිගය නැති ගොනා වැනී"

මෙම කවි සඳහා ද "ගොනා" යන පදය වෙනසක් නැතිව යොදාගෙන ඇත. කෙසේ නමුදු ගැමි සංස්කෘතිය තුළ ගවයා තමන්ට කිරි ටික, ගොම ටික දෙනු පමණක් නොව විවිධ වූ කාර්තව්‍යයන්හිදී තමාට උපකාරී වන සතුක සේ සලකා කිසියම් ආකාරයට වැදගත් කමකින් සලකනු ලැබූවෙකි. එසේ වුවද ඉහත සඳහන් ජන කවිවල "පව් කළ ගොනෝ" යන යෙදුමත් "ගොන් දෙන්නෙක්", "එක ගොනෙක්" "වලිගය ඇති ගොනා" සහ "වලිගය නැති ගොනා" යනාදී වශයෙන් "ගොනා" යන යෙදුම් ඒ අයුරින්ම යොදා ගත්තේ ද එම සත්වයාට දක්වන සැලකිල්ල අඩු කිරීමක් ලෙස නොවේ.

ඉහත දැක්වූ කරත්ත කවිය මගින් ජන කවියා තම අසරණ ගවයාගේ සානුකම්පිත තත්ත්වය හඟවන අතර එම අසරණ තත්ත්වය තමන් වෙත ද ආරෝපණය කර ගන්නා අයුරු පැහැදිලි වෙයි. හපුතලේ කන්ද දැකලා බඩ දන්නේ සිය කරත්තය දක්කන ගොනුන් ගැන සිහිපත් වීමෙන් පමණක්ම නොවිය හැකිය. ගොනුන් බැඳි කරත්තය දක්කාගෙන මෙම ගැල්කරු හපුතලේ කන්ද නැග යන්නේ සිය ජීවිකාව සඳහාය. එම කර්තව්‍යය ඉටු කර ගැනීමට තමන්ට පිහිට වන ගොනා ද තමන් මෙන්ම අසරණ බව හැඟවීමට කවියා යොදාගෙන ඇත්තේ "පව් කළ ගොනෝ" යන යෙදුමය.



සිංහල සංස්කෘතිය තුළ බුදු දහමෙන් ඉගැන්වෙන කර්ම පල පිළිබඳව විශ්වාසය පාදක කොටගෙන මෙලොවදී කෙනෙකුට දුෂ්කර ජීවිතයක් ගෙවන්නට සිදු වන්නේ පෙර කළ පව් පල දීමෙන් බව ගැමි ජනතාව බොහෝ විට සිතන දෙයකි. සිය කරත්තයෙහි බැඳි ගොනාට ද එවන් තිරිසන් ආත්මයක් ලැබී ඇත්තේ ද පෙර කළ පව් නිසා යයි ඉඟියෙන් කීමක් මෙහි දැකගත හැකිය. තමා මෙන්ම තමන් විසින් වැඩෙහි යොදවනු ලබන ගොන ද පෙර කළ පව්වල පලවිපාක විඳින අසරණයන්ගේ තත්ත්වයෙහිලා සැලකිමක් මේ කවෙන් ධ්වනිත වෙයි.

ලබන කලාපයට